# 4

# මිල සහ වැටුප්

## 4.1 සමස්ත නිරීක්ෂණ

තිල පාරිභෝගික මිල දර්ශක මගින් මනිනු ලබන පොදු මිල මට්ටම 2022 වසරේ දී මින් පෙර පෙන්නුම් නොකළ තීව්‍ර ඉහළ යෑමක් වාර්තා කළ අතර, මේ සඳහා දේශීය හා ගෝලීය වශයෙන් සැපයුම් අංශයේ පැවති අහිතකර තත්ත්වයන්, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම සහ පසුගිය වසර කිහිපය තුළ සිදු කළ මුදල් ලිහිල්කරණයේ පසු බලපෑම් හේතු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙන්ම සැපයුම් තත්ත්වයන්ගේ වර්ධනය හේතුවෙන් වසර අවසානය වන විට මිල මට්ටම ඉහළ යෑමේ වේගය පාලනය විය. 2022 වසරේ දී දේශීයව නිෂ්පාදනය කරන ආහාර අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා නිෂ්පාදන යෙදවුම් හිඟ වීම හා ඒවායෙහි මිල ඉහළ යෑම මූලික කොටගෙන දේශීය කෘෂි නිෂ්පාදන සැලකිය යුතු ලෙස පහළ වැටීම සහ ඉන්ධන හිඟය හේතුකොටගෙන නිෂ්පාදන බෙදාහැරීම් සඳහා ඇති වූ අවහිරතා හේතු විය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ඉහළ යෑම, නැව් ගාස්තු ඉහළ යෑම සහ විශේෂයෙන්ම ශ්‍රී ලංකා රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයනික ආහාර සහ ආහාර නොවන අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එය පොදු මිල මට්ටම ඉහළ යෑම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළේය. තවද, පරිපාලිත මිල ගණන් ඒවායේ නිෂ්පාදන පිරිවැය පිළිබිඹු වන පරිදි ඉහළ දැමීම මෙන්ම එකතු කළ අගය මත බද්ද ඉහළ නැංවීම හා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම ද ආහාර සහ ආහාර නොවන අයිතමවල මිල ගණන් තවදුරටත් ඉහළ යෑමට හේතු විය. එසේ වුවද, දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඇති වූ හිතකර ප්‍රවණතා සමඟ වසර අවසානය වන විට ඉහත සඳහන් කරන ලද අහිතකර තත්ත්වයන් බොහෝදුරට සමනය විය. මේ අනුව, දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් ඉල්ලුමෙන් හටගත් උද්ධමන පීඩනය පාලනය වීමත්, නිෂ්පාදන යෙදවුම් ක්‍රමයෙන් වෙළඳපොළට පැමිණීමත් සමඟ දේශීය සැපයුම ඉහළ යෑමත් සිදු වූ අතර, එමගින් පොදු මිල මට්ටම ඉහළ යෑමේ වේගය මන්දගාමී විය. අන්තර්-බැංකු එතැන් විදේශ විනිමය වෙළඳපොළ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කරන ලද මගපෙන්වීම් හේතුවෙන් විනිමය අනුපාතිකය ස්ථායී වීම අතරතුර ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල අඩු වීම් නිසා ආනයනික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම පාලනය වූ අතර, එයින් පොදු මිල මට්ටම මත ඇති වූ පීඩනය වසර අග භාගයේ දී තවදුරටත් පහත වැටුණි. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය 2022 සැප්තැම්බර් මාසය දක්වා ඉහළ ගොස්, ඉන් අනතුරුව පහළ යෑමේ මාවතට අවතීර්ණ විය. නිෂ්පාදක මිල දර්ශකය (නි.මි.ද., 2018 සිව්වන කාර්තුව=100) මත පදනම් වූ උද්ධමනය 2022 අගෝස්තු මාසය දක්වා ඉහළ ගිය අතර, ඉන් අනතුරුව වසර අවසානය දක්වා පහළ ගියේය. වැටුප් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, 2022 වසර තුළ විධිමත් හා අවිධිමත් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ නාමික වැටුප්වල ඉහළ

*යැම් නිරීක්ෂණය විය. විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් සංශෝධනය කිරීම, ජීවන වියදම ඉහළ යැම මධ්‍යයේ අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් ඉහළ වැටුප් ඉල්ලා සිටීම සහ රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිකයන් සඳහා විශේෂ දීමනාවක් ලබා දීම, මෙම ඉහළ යැම් සඳහා හේතු විය. කෙසේ වුවද, භාණ්ඩ හා සේවා මිල ඉහළ යැමට මුළුමනින්ම අනුරූප වූ වැටුප් ඉහළ යැමක් දක්නට නොලැබුණි. එබැවින් ආර්ථිකයක මිල හා වැටුප් වැඩිවීම මගින් සිදුවන සර්පිලාකාර බලපෑමක් ඇති නොවූ අතර මූර්ත වැටුප්වල පහළ යැමක් දක්නට ලැබුණි.*



## 4.2 මිල

### පොදු මිල මට්ටමේ විචලන

**නිල පාරිභෝගික මිල දර්ශක, එනම් කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය[1] මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2022 මාර්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය අතර කාලයේ දී පෙන්නුම් කළ ශීඝ්‍ර වර්ධනයත් සමඟ, වසර පුරා අඛණ්ඩ ඉහළ යැමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් ක්‍රියාවට නැංවූ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම සැපයුම් තත්ත්වයන්ගේ සිදු වූ වර්ධනයන් හේතුවෙන් සමස්ත ඉල්ලුම් පීඩනය මන්දගාමී වීම නිසා වසර අවසානය වන විට පොදු මිල මට්ටම ඉහළ යැමේ වේගයේ යම් අඩුවීමක් දක්නට ලැබුණි.** දේශීය කෘෂිකාර්මික අංශය සැලකිය යුතු ලෙස දුර්වල වීම, ශ්‍රී ලංකා රුපියල කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වීම, දේශීය වෙළඳපොළ තුළ විදේශ මුදල් ප්‍රමාණවත්ව නොපැවතීම, ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ඉහළ යැම, ඉහළ නැව් ගාස්තු මෙන්ම ඉන්ධන හිඟය හා ඉහළ ඉන්ධන පිරිවැය වැනි 2022 වසර තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන්, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල විචලන කෙරෙහි බලපෑම් ඇති කරන ලදී. මීට අමතරව, ඇතැම් භාණ්ඩ සඳහා වෙළඳපොළ පදනම් කරගත් මිල සූත්‍ර අනුගමනය කිරීම, පරිපාලිත අයිතමවල මිල ගණන් ඉහළ නැංවීම සහ විවිධ බදු ඉහළ දැමීම ද පොදු මිල මට්ටම ඉහළ යැම කෙරෙහි බලපාන ලදී. කෙසේ වෙතත්, පොහොර සැපයුම සම්බන්ධයෙන් පැවති ගැටලු හේතුවෙන් ආහාර අයිතමවල මිල ගණන් කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම, පොහොර සැපයුම වැඩිදියුණු වීමත් සමඟ යම්තාක් දුරකට සමනය වූ අතර, අන්තර්-බැංකු එතැන් විදේශ විනිමය වෙළඳපොළ සඳහා මහ බැංකුව විසින් සිදු කරන ලද මගපෙන්වීම් හේතුවෙන් විනිමය අනුපාතිකය ස්ථාවර වීම 2022 වසර අග භාගය වන විට ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම ආනයනික අයිතමවල මිල ගණන් පහළ යැම සඳහා දායක විය.

**ආහාර කාණ්ඩයේ අයිතමවල මිල 2022 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන් අනතුරුව සුළු වශයෙන් පහළ යැමේ ප්‍රවණතාවක් අනුගමනය කළේය.** මේ අතර, නිතර මිල උච්චාවචන සහිත ආහාර[2] සහ අනෙකුත් ආහාර[3] යන කාණ්ඩ දෙකෙහි අයිතමවල මිල ගණන්, 2022 වසර තුළ සිදු වූ ආහාර කාණ්ඩයේ මිල විචලනයන්ට දායක විය. දේශීය වෙළඳපොළෙහි රසායනික පොහොර ප්‍රමාණවත් පරිදි නොපැවතීම සහ වෙළඳපොළෙහි පැවති රසායනික පොහොරවල මිල ඉතා අධික වීම නිසා ප්‍රධාන වශයෙන් 2021/2022 මහ කන්නයේ අස්වැන්න පහළ යැම හේතුවෙන් සමස්ත දේශීය සැපයුම පහත වැටුණු අතර, එමගින් දේශීයව නිෂ්පාදනය කරන ලද ආහාර අයිතමවල මිල ඉහළ ගියේය. පසුව රජය විසින් රසායනික පොහොර යොදා ගනිමින් වගා කටයුතු කිරීම සඳහා ගොවීන්ට පහසුකම් සලසා දුන් නමුත් එමගින් යල කන්නයේ අස්වැන්න පෙර පැවති මට්ටමට ඉහළ නංවා ගැනීමට නොහැකි විය. මේ අතර, අවස්ථා ගණනාවක දී සිදු කළ සැලකිය යුතු ඉන්ධන මිල ඉහළ නැංවීම් හේතුවෙන් ප්‍රවාහන ගාස්තු ඉහළ යැම සහ අයහපත් කාළගුණ තත්ත්වයන් හේතුකොටගෙන ඇති වූ සැපයුම් අවහිරතා ද දේශීය ආහාර අයිතමවල මිල ඉහළ යැම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. දේශීය සහ ආනයනික සහල් වර්ගවල මිල ගණන් 2022 ජූලි මාසය දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ හේතුවෙන් රජයට දේශීය සහල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පැනවීමට සිදුවිය. ඒ අනුව, 2022 මැයි මස 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය සම්බා සහල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 230ක් සහ නාඩු සහල්


1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින්, නිල පාරිභෝගික මිල දර්ශක, එනම් කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. මාසික පදනමින් සම්පාදනය කරයි. කො.පා.මි.ද. මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික නිවාස නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස් වීම් පෙන්නුම් කරන අතර, ජා.පා.මි.ද. මගින් එය ජාතික මට්ටමින් පෙන්නුම් කරයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කො.පා.මි.ද. (2013=100) සහ ජා.පා.මි.ද. (2013=100) සම්පාදනය කිරීම නවතන ලද අතර, ඒවා පිළිවෙළින් 2023 පෙබරවාරි සහ 2023 ජනවාරි සිට කො.පා.මි.ද. (2021=100) සහ ජා.පා.මි.ද. (2021=100) මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය හා මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

3 නිතර මිල උච්චාවචන සහිත අයිතම හැර අනෙකුත් ආහාර අයිතම.

**4.1 රූප සටහන**
**මිල සහ වැටුප් විචලන - 2022**


**2022 වසරේ දී මිල ගණන් පෙර නොවූ විරූ වැඩිවීමක් වාර්තා කළ අතර මූර්ත වැටුප් තියුණු ලෙස පහළ යන ලදී...**




(අ) 2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි (2013=100) අයිතමවල මිලෙහි ප්‍රතිශත වෙනස වේ.
(ආ) කො.පා.මි.ද. (2013=100) සහ ජා.පා.මි.ද. (2013=100) මත පදනම් වූ බර තැබීම් වේ.
(ඇ) නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුළත් වේ.
(ඈ) අනෙකුත් ආහාර කාණ්ඩයට නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම හැර අනෙකුත් ආහාර ඇතුළත් වේ.
(ඉ) නාමික සහ මූර්ත වැටුප් වෙනස ලෙස 2021 සහ 2022 වසරවල සාමාන්‍ය අතර ප්‍රතිශතමය වෙනස දක්වා ඇත.
(ඊ) පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වේ.


කිලෝග්‍රෑමයක් මත රුපියල් 220ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් පනවන ලද අතර, 2022 ජුනි මස 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය රතු කැකුළු සහල් සහ සුදු කැකුළු සහල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 210ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. අනතුරුව, දේශීය සහල් වර්ගවල මෙන්ම ආනයනික සහල් වර්ගවල මිල ද පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකාවට විදේශ පරිත්‍යාග වශයෙන් ලැබුණු සහල් තොග රජය විසින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නොමිලයේ බෙදා දීම හේතුවෙන් සහල් සඳහා වූ ඉල්ලුම පහළ යෑම ද සහල් මිල පහළ යෑම කෙරෙහි බලපාන ලදී. 2022 වසරේ

**4.2 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - සහල්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**4.3 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - එළවළු**




(අ) බෝංචි, කැරට්, ගෝවා, බීට්රූට්, ලීක්ස්, තක්කාලි සහ රාබුවල සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.
(ආ) වම්බටු, වට්ටක්කා, මැකරල්, බණ්ඩක්කා, කරවිල සහ පතෝලවල සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.4 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - පොල් (මධ්‍යම)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.5 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - මාළු (අ)**





(අ) කෙලවල්ලා, තලපත්, පරා, බලයා, ගල් මාළු, තෝරා, මෝරා, සාලයා, හුරුල්ලා, හාල්මැස්සා, කුම්බලාවා සහ ලින්නා සතිපතා මිල ගණන්හි සාමාන්‍ය වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


මුල් මාසවල දී එළවළු මිල පහත වැටීමක් පෙන්නුම් කළ ද, ඉන්ධන හිඟය, ඉහළ ප්‍රවාහන වියදම්, අයහපත් කාලගුණ තත්ත්වයන් මෙන්ම පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය හිඟය හේතුවෙන් සැපයුමට ඇති වූ බාධා නිසා 2022 අප්‍රේල් සිට ජුනි දක්වා මාසවල දී එළවළු මිල ගණන් ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. වසරේ දෙවන භාගයේ දී එළවළු මිල ගණන් ඉහළ මට්ටමක පැවතිය ද, 2022 ජූලි සහ සැප්තැම්බර් මාස අතර කාලයේ දී එළවළු මිලෙහි සුළු අඩු වීමක් පෙන්නුම් කළේය. මේ අතර, ඉහළ නිෂ්පාදන පිරිවැය මෙන්ම කුකුළු ආහාර, විටමින් හා බෙහෙත් ද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් 2022 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ කුකුළු මස් මිල අඛණ්ඩව ඉහළ ගියේය. තවද, අහිතකර කාලගුණ තත්ත්වයන් ඇතුළුව ඉන්ධන හිඟය සහ ඉන්ධන මිල ඉහළ යෑම් හේතුකොටගෙන ධීවර කටයුතු අඩාල වීම නිසා, 2022 අප්‍රේල් මාසය දක්වා ස්ථාවරව පැවති නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉන් අනතුරුව 2022 සැප්තැම්බර් මාසය දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඉන් පසුව, ධීවර කටයුතු සඳහා භූමිතෙල් සැපයීමට ප්‍රමුඛත්වය දිය යුතු බවට රජය විසින් ගනු ලැබූ තීරණය වසරේ අවසාන මාස තුන තුළ මත්ස්‍ය මිල ගණන්වල පෙන්නුම් කළ පහළ යෑමට යම් දායකත්වයක් දක්වන ලදී. 2022 වසර තුළ බිත්තර නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුකොටගෙන බිත්තර මිල අධික ලෙස ඉහළ ගියේය. මේ අතර, අසාධාරණ ලෙස බිත්තර මිල ඉහළ යෑම මගින් පාරිභෝගිකයන් අගතියට පත් වීම වැළැක්වීමේ අරමුණින්, 2022 අගෝස්තු මස 19 වන දින සිට බලපැවැත්වෙන පරිදි සුදු බිත්තරයක් මත රුපියල් 43ක් ලෙස උපරිම සිල්ලර මිලක් පනවනු ලැබූ නමුත්, 2022 අවසාන කාර්තුවේ දී, බිත්තරයක මිල රුපියල් 50ක් දක්වා අඛණ්ඩව ඉහළ ගියේය. උත්සව සමයේ දී බිත්තර ඉල්ලුම ඉහළ යෑම ද මෙලෙස බිත්තර මිල ඉහළ යෑම කෙරෙහි යම් බලපෑමක් ඇති කළේය.

**4.6 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - අර්තාපල්**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.7 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - ආනයනික ලොකු ළූණු**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.8 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - සීනි සහ තිරිඟු පිටි**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**4.9 රූප සටහන**
**සතිපතා සිල්ලර මිල - පරිප්පු**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යෑම කෙරෙහි විදේශ විනිමය හිඟය, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ඉහළ යෑම, නැව් ගාස්තු ඉහළ යෑම සහ ආර්ථික පසුබෑම සැලකිල්ලට ගනිමින් පැනවූ ආනයන සීමා ප්‍රධාන වශයෙන් හේතු විය.** විශේෂයෙන්ම, 2022 මාර්තු මාසයේ සිට විනිමය අනුපාතිකය වෙළඳපොළ බලවේග අනුව තීරණය වීමට ඉඩ හැරීමත් සමග දේශීය වෙළඳපොළේ ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ ගියේය. මේ අතර, සීනි, පරිප්පු, ලොකු ළූණු, වියළි මිරිස් සහ අර්තාපල් වැනි ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යෑම කෙරෙහි ලෝක වෙළඳපොළේ වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම ද හේතු විය. 2022 ජූනි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනික අර්තාපල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 20ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පැන වූ අතර, දේශීය ලොකු ළූණු ගොවීන් ආරක්ෂා කිරීම සඳහා 2022 සැප්තැම්බර් මස 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලොකු ළූණු කිලෝග්‍රෑමයක් මත පනවා තිබූ රුපියල් 50ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, දේශීය ලොකු ළූණු කන්නය අවසන් වීමෙන් පසු 2022 දෙසැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 10ක් ලෙස සංශෝධනය කරන ලදී. තවද, වෙළඳපොළ හැසිරීමට අනුව තිරිඟු පිටි, පාන් සහ කිරිපිටි මිල තීරණය වීමට ඉඩ හැරීමත් සමඟ ඒවායේ මිල ගණන් 2022 වසර තුළ දී නිරන්තර සංශෝධනයන්ට ලක් විය. තිරිඟු පිටි මිල ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස 2022 වසර ආරම්භයේ දී රුපියල් 80ක් වශයෙන් පැවති ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල දෙසැම්බර් මාසය වන විට රුපියල් 140ත් රුපියල් 200ත් අතර මිල පරාසයක පැවතුණි. මේ අතර, තිරිඟු පිටි මිල ඉහළ යෑමට අමතරව, එල්.පී. ගෑස් සහ විදුලි බිල ඉහළ යෑම හේතුවෙන් අනෙකුත් බේකරි අයිතමවල මිල ගණන් ද 2022 වසරේ දී සැලකිය යුතු සංශෝධනයන්ට ලක් විය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි කිරිපිටි මිල ඉහළ යෑම සහ නැව් ගාස්තු ඉහළ යෑම සැලකිල්ලට

**4.1 සංඛ්‍යා සටහන**
**තෝරා ගත් අයිතමවල සිදු වූ පරිපාලිත මිල සංශෝධන - 2022**

| අයිතමය | ඒකකය | සංශෝධිත මිල (රු.) | බලපැවැත් වූ දිනය |
|---|---|---|---|
| **කිරි පිටි** | | | |
| ආනයනික | | | |
| ඇන්කර් | ග්‍රෑම් 400 | 790.00 | 2022.03.19 |
| | ග්‍රෑම් 400 | 1,020.00 | 2022.04.05 |
| | ග්‍රෑම් 400 | 1,160.00 | 2022.06.16 |
| | ග්‍රෑම් 400 | 1,240.00 | 2022.10.05 |
| දේශීය | | | |
| හයිලන්ඩ් | ග්‍රෑම් 400 | 495.00 | 2022.03.10 |
| | ග්‍රෑම් 400 | 625.00 | 2022.04.12 |
| | ග්‍රෑම් 400 | 850.00 | 2022.06.23 |
| | ග්‍රෑම් 400 | 950.00 | 2022.10.05 |
| **එල්.පී. ගෑස්** | | | |
| ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | කි.ග්‍රෑ. 12.5 | 4,860.00 | 2022.04.27 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,910.00 | 2022.07.11 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,664.00 | 2022.08.09 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,551.00 | 2022.09.06 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,280.00 | 2022.10.06 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,360.00 | 2022.11.06 |
| | කි.ග්‍රෑ. 12.5 | 4,610.00 | 2022.12.06 |
| ලාෆ්ස් ගෑස් ලංකා සමාගම | කි.ග්‍රෑ. 12.5 | 4,199.00 | 2022.03.20 |
| | කි.ග්‍රෑ. 12.5 | 6,850.00 | 2022.06.05 |
| | කි.ග්‍රෑ. 12.5 | 5,800.00 | 2022.08.18 |
| | කි.ග්‍රෑ. 12.5 | 5,300.00 | 2022.10.11 |
| **ඉන්ධන** | | | |
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | | | |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 184.00 | 2022.02.07 |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 204.00 | 2022.02.26 |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 254.00 | 2022.03.11 |
| ලං.ඛ.නී.සං. | ලීටර් 1 | 254.00 | 2022.03.12 |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 303.00 | 2022.03.26 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 338.00 | 2022.04.18 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 420.00 | 2022.05.24 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 470.00 | 2022.06.26 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 450.00 | 2022.07.17 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 410.00 | 2022.10.02 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 370.00 | 2022.10.17 |
| සුදු ඩීසල් | | | |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 124.00 | 2022.02.07 |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 139.00 | 2022.02.26 |
| ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 214.00 | 2022.03.11 |
| ලං.ඛ.නී.සං. | ලීටර් 1 | 176.00 | 2022.03.12 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 289.00 | 2022.04.18 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 400.00 | 2022.05.24 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 460.00 | 2022.06.26 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 440.00 | 2022.07.17 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 430.00 | 2022.08.01 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 415.00 | 2022.10.17 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 430.00 | 2022.11.13 |
| ලං.ඛ.නී.සං. සහ ලංකා අයි.ඕ.සී. | ලීටර් 1 | 420.00 | 2022.12.06 |
| භූමිතෙල් | | | |
| ලං.ඛ.නී.සං. | ලීටර් 1 | 340.00 | 2022.08.22 |
| ලං.ඛ.නී.සං. | ලීටර් 1 | 365.00 | 2022.11.13 |
| **අවම බස් ගාස්තුව** | | 17.00 | 2022.01.05 |
| | | 20.00 | 2022.03.13 |
| | | 27.00 | 2022.04.20 |
| | | 32.00 | 2022.05.25 |
| | | 40.00 | 2022.07.01 |
| | | 38.00 | 2022.07.20 |
| | | 34.00 | 2022.08.05 |
| **අවම දුම්රිය ගාස්තුව** | | 20.00 | 2022.07.25 |

*(සම්බන්ධයි)*

**4.1 සංඛ්‍යා සටහන (සම්බන්ධයි)**
**තෝරා ගත් අයිතමවල සිදු වූ පරිපාලිත මිල සංශෝධන - 2022**

| අයිතමය | ඒකකය | සංශෝධිත මිල (රු.) | බලපැවැත් වූ දිනය |
|---|---|---|---|
| **විදුලි ගාස්තු - ස්ථාවර** | | | |
| ඒකක 60ට අඩු | 0-30 | 120.00 | 2022.08.10 |
| | 31-60 | 240.00 | 2022.08.10 |
| ඒකක 60ට වැඩි | 0-60 | - | 2022.08.10 |
| | 61-90 | 360.00 | 2022.08.10 |
| | 91-120 | 960.00 | 2022.08.10 |
| | 121-180 | 960.00 | 2022.08.10 |
| | 180ට වැඩි | 1,500.00 | 2022.08.10 |
| **විදුලි ගාස්තු - ඒකක** | | | |
| ඒකක 60ට අඩු | 0-30 | 8.00 | 2022.08.10 |
| | 31-60 | 10.00 | 2022.08.10 |
| ඒකක 60ට වැඩි | 0-60 | 16.00 | 2022.08.10 |
| | 61-90 | 16.00 | 2022.08.10 |
| | 91-120 | 50.00 | 2022.08.10 |
| | 121-180 | 50.00 | 2022.08.10 |
| | 180ට වැඩි | 75.00 | 2022.08.10 |
| **ජල ගාස්තු - ගෘහස්ත** | | | |
| ඒකක ගාස්තුව | 0-5 | 20.00 | 2022.09.01 |
| | 06-10 | 27.00 | 2022.09.01 |
| | 11-15 | 34.00 | 2022.09.01 |
| | 16-20 | 68.00 | 2022.09.01 |
| | 21-25 | 99.00 | 2022.09.01 |
| | 26-30 | 150.00 | 2022.09.01 |
| | 31-40 | 179.00 | 2022.09.01 |
| | 41-50 | 204.00 | 2022.09.01 |
| | 51-75 | 221.00 | 2022.09.01 |
| | 75ට වැඩි | 238.00 | 2022.09.01 |


මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ජාතික ගමනාගමන කොමිෂන් සභාව
ලංකා විදුලිබල මණ්ඩලය
ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

ගනිමින් ආනයනික කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල අවස්ථා හතරක දී ඉහළ දමන ලදී. එමෙන්ම, නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් දේශීය කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල ද අවස්ථා කිහිපයක දී ඉහළ දමනු ලැබීය. පරිප්පු, සුදු සීනි සහ කරවල මිල ගණන් 2022 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2022 වසරේ අග භාගයේ දී ඒවායේ දේශීය මිල ගණන් ද පහළ ගියේය. තවද, ආනයන ඉල්ලුම සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ විනිමය අනුපාතිකය ස්ථාවර වීම හේතුවෙන්, 2022 වසරේ අග භාගයේ දී ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ගණන්වල පහළ යෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, 2022 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැනවූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින්, 2022 වසර අවසානය වන විට ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑමට යම් බලපෑමක් ඇති කරන ලදී.

**ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2022 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ යැමක් පෙන්නුම් කළ අතර, දේශීය හා ගෝලීය ආර්ථික පසුබෑම් මධ්‍යයේ විනිමය අනුපාතිකය දැඩි ලෙස අවප්‍රමාණය වීම සහ දේශීය වෙළඳපොළ තුළ විදේශ මුදල් හිඟ වීම වැනි අහිතකර තත්ත්වයන් ඊට හේතු විය.** රුපියල අවප්‍රමාණය වීම මෙන්ම වෙළඳපොළ මිල ගණන් ඉහළ යැම හා අනුගත වෙමින් රජය විසින් නියාමනය කරනු ලැබූ ඛනිජ තෙල් මිල (ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව), එල්.පී. ගෑස් (ලිට්‍රෝ) මිල සහ බස් ගාස්තු, 2022 වසරේ අවස්ථා කිහිපයක දී ඉහළ දමන ලදී. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (ලංකා අයි.ඕ.සී.) යන ආයතන විසින්, පෙට්‍රල් (ඔක්ටේන් 92) සහ සුදු ඩීසල් මිල, 2022 වසර තුළ කිහිප අවස්ථාවක දී සංශෝධනය කරන ලදී. විශේෂයෙන්ම, 2022 සැප්තැම්බර් මාසයේ සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා අයි.ඕ.සී. ආයතනය විසින් සිදු කරන ලද ඉන්ධන මිල සංශෝධන අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මිල සූත්‍රය මත පදනම් විය. ඉන්ධන මිල ඉහළ නැංවීමත් සමඟ පාසල් වෑන් රථ, කුලී රථ සහ ත්‍රීරෝද රථ ගාස්තු ද 2022 වසරේ අවස්ථා කිහිපයක දී ඉහළ ගියේය. කෙසේ වුවද, සුදු ඩීසල් මිල පහළ යැමත් සමඟ බස් ගාස්තු 2022 ජූලි මස 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 2.23ක් සහ 2022 අගෝස්තු මස 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 11.14ක් වශයෙන් අවස්ථා දෙකක දී පහළ ගියේය. එමෙන්ම, 2022 වසර තුළ දෙවතාවක දී භූමිතෙල් මිල සංශෝධනය වීම හේතුවෙන් 2022 වසරේ දී භූමිතෙල් මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එමෙන්ම, ඉන්ධන හිඟය සහ ඉන්ධන මිල ඉහළ යැම මගින් ඇති වූ අහිතකර බලපෑම් ආර්ථිකයේ සෑම අංශයකටම සම්ප්‍රේෂණය වූ අතර, වසර හතරකට පමණ පසු 2022 ජූලි මස 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි දුම්රිය ගාස්තු ඉහළ දමන ලදී. තවද, රුපියල අවප්‍රමාණය වීම සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම මගින් ඇතිවුණු බලපෑම පිළිබිඹු කරමින්, වාහන අමතර කොටස් මිල සහ වාහන සේවා ගාස්තු ද 2022 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේ දී සකස් කළ ආහාරවල මිල ගණන් අඛණ්ඩව ඉහළ ගිය අතර, මේ සඳහා කිලෝග්‍රෑම් 12.5ක් බරැති එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල අවස්ථා කිහිපයක දී සංශෝධනය වීම හේතු විය. වසර අටකට ආසන්න කාලයක් නොවෙනස්ව පැවති විදුලි ගාස්තු, ජනන පිරිවැය සහ බෙදා හැරීමේ පිරිවැය පියවා ගැනීම සඳහා 2022 අගෝස්තු මස 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 75කින් සැලකිය යුතු ලෙස ඉහළ දමන ලදී. මීට අමතරව, වසර 10කට ආසන්න කාලයක් සංශෝධනය නොවූ ජල ගාස්තු ද 2022 සැප්තැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රුපියල අවප්‍රමාණය වීම, ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් ඉහළ යැම, නැව් ගාස්තු ඇතුළු ප්‍රවාහන වියදම් ඉහළ යැම සහ ආනයන සීමා පැනවීමෙන් ඇති වූ භාණ්ඩ හිඟය හේතුවෙන් ගෘහ ඒකක නඩත්තුව හා ඒ ආශ්‍රිත උපකරණවල අඛණ්ඩ මිල ඉහළ යැමක් 2022 වසර තුළ දී වාර්තා විය. තවද, ආර්ථික තත්ත්වය අයහපත් වීම හේතුකොටගෙන 2022 අප්‍රේල් මාසයේ දී පමණක් නිවාස කුලියෙහි සුළු ඉහළ යැමක් පෙන්නුම් කරන ලදී. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර ගාස්තු සහ පෞද්ගලික රෝහල් ගාස්තු වැනි පාරිභෝගික භාණ්ඩ පැසට ඇතුළත් වී ඇති සෞඛ්‍ය සේවාවලට අදාළ වියදම් 2022 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, සියයට 11.25ක් වශයෙන් පැවති විදුලි සංදේශ බද්ද, 2022 ජුනි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 15ක් දක්වා ඉහළ දමන ලදී. එමෙන්ම, සියයට 8ක් වශයෙන් පැවති එකතු කළ අගය මත බද්ද, 2022 ජුනි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 12 දක්වා ඉහළ දැමීම, ඉන් අනතුරුව 2022 සැප්තැම්බර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 15 දක්වා ඉහළ දැමීම සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හඳුන්වා දීම, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් තවදුරටත් ඉහළ යැමට හේතු විය. රජය විසින් මහජනතාවට සහන සැලසීමේ අරමුණින්, ඉන්ධන, එල්.පී. ගෑස් වැනි ප්‍රධාන ආනයනික අයිතම කිහිපයක මිල සහ විදුලිය, ජලය, බස්, දුම්රිය, විදුලි සංදේශ සහ තැපැල් වැනි අත්‍යවශ්‍ය සේවාවල ගාස්තු කාලයක් පුරා සැලකිය යුතු වශයෙන් ඉහළ නොදමා ස්ථාවර මට්ටම්වල පවත්වා ගත් නමුත්, පවත්නා ආර්ථික තත්ත්ව යටතේ එය තවදුරටත් සිදු කළ නොහැකි කාර්යයක් බවට පත්ව ඇත. පසුගිය වසර කිහිපය තුළ පරිපාලිත භාණ්ඩ සහ සේවාවල මිල ගණන් කෘතිමව පහළ මට්ටමක රඳවා ගැනීමකින් තොරව, ලෝක වෙළඳපොළ මිල සහ විනිමය අනුපාතිකයේ විචලනයන්ට අනුකූලව, ක්‍රමානුකූලව සංශෝධනය කළේ නම්, 2022 වසර තුළ දී සිදු වූ අසාමාන්‍ය ලෙස මිල ගණන් ඉහළ යැම මගහරවා ගැනීමටත්, ඉන් මහජනතාවට ඇති වූ පීඩනය අවම කර ගැනීමටත් හැකියාව තිබුණි. විශේෂයෙන්ම, රජය විසින් මිල සහනාධාර ලබා දීමේ දී, ආර්ථිකයේ සියලුම අංශවල ශක්තීන් සහ දුර්වලතා මැනවින් සලකා බලා රටේ මැදි සහ දිගු කාලීන ආර්ථික පුනර්ජීවනයට බලපෑමක් නොවන පරිදි එම කටයුතු සිදු කළ යුතුය.

4


**4.10 රූප සටහන**
**කො.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2022**




(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස්, ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.11 රූප සටහන**
**ජා.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2022**




(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස්, ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

4

## පාරිභෝගික මිල දර්ශක

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.)

**කො.පා.මි. දර්ශකය (2013=100) 2022 ජනවාරි මාසයේ පැවති දර්ශකාංක 158.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 243.2 දක්වා ඉහළ ගියේය.** 2022 වසරේ ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ කො.පා.මි. දර්ශකයෙහි වාර්තා වූ වේගවත් ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම සිදු වූ මාසික මිල ඉහළ යෑම් හේතු වූ අතර, 2022 ජුනි මාසය හැර ඉතිරි මාසවල දී ඒ සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම් වැඩි දායකත්වයක් දක්වන ලදී. 2022 වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවල දී කො.පා.මි. දර්ශකයෙහි නිරීක්ෂණය වූ මාසික පහළ යෑම් සඳහා ආහාර කාණ්ඩය ප්‍රධාන දායකත්වයක් දක්වන ලදී. කො.පා.මි.ද. ගණනය කිරීම ආරම්භයේ සිට මේ දක්වා, එම දර්ශකයේ මෙන්ම ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පෙන්නුම් කළ ඉහළම මාසික වෙනස්වීම් ප්‍රතිශත 2022 ජුනි මාසයේ දී වාර්තා වූ අතර, ඒවා පිළිවෙළින්, සියයට 12.8ක්, සියයට 18.9ක් සහ සියයට 9.4ක් විය. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 14.2හි සිට අඛණ්ඩව ඉහළ ගොස් 2022 සැප්තැම්බර් මාසයේ දී මෙතෙක් වාර්තා කළ ඉහළම අගය වන සියයට 69.8 වාර්තා කරන ලදී. කෙසේ වුවද, අපේක්ෂා කළ පරිදිම 2022 ඔක්තෝබර් මාසයේ දී උද්ධමනය පහළ යෑමේ ක්‍රියාවලිය ආරම්භ වූ අතර, ඒ අනුව, මතුපිට උද්ධමනය 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 57.2ක් කරා ළඟා විය.

### ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.)

**ජා.පා.මි. දර්ශකය (2013=100) 2022 ජනවාරි මාසයේ වාර්තා කළ දර්ශකාංක 166.0හි සිට දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 256.3 දක්වා ළඟා විය.** කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස්වීම්වලට සමගාමීව, 2022 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාල සීමාව තුළ ජා.පා.මි. දර්ශකයෙහි වාර්තා වූ ඉහළ යෑම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මිල ගණන් ඉහළ යෑම් දායක විය. කෙසේ වුවද, 2022 ඔක්තෝබර් මාසයේ වාර්තා වූ මාසික ඉහළ යෑම සඳහා ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන් ඉහළ යෑම පමණක් හේතු විය. මේ අතර, 2022 නොවැම්බර් මාසයේ නිරීක්ෂණය වූ මාසික වෙනසෙහි පහළ යෑම සඳහා ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම හේතු විය. 2022 දෙසැම්බර් මාසයේ දී ජා.පා.මි. දර්ශක අගය නොවැම්බර් මාසයේ දර්ශක අගය හා සම මට්ටමේ පැවති අතර, ඒ සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම, ආහාර කාණ්ඩයේ මිල ගණන්හි සිදු වූ පහළ යෑම මගින් නිශේධනය වීම හේතු විය. විශේෂයෙන්ම, ජා.පා.මි.ද. ගණනය කිරීම ආරම්භයේ සිට මේ දක්වා ආහාර කාණ්ඩයේ වාර්තා වූ ඉහළම මාසික වැඩිවීම වන සියයට 14.2, 2022 ජුනි මාසයේ දී වාර්තා වූ අතර,

**විශේෂ සටහන 6**

## පාරිභෝගික මිල දර්ශකයන්ගේ පදනම් වර්ෂ 2021 ලෙස යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකාවේ නිල පාරිභෝගික මිල දර්ශක සම්පාදනය කිරීමේ වගකීම දරන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් එම දර්ශකවල 2013 ලෙස පැවති පදනම් වර්ෂය 2021 වශයෙන් යාවත්කාලීන කරනු ලැබීය. කාලයත් සමඟ වෙනස් වන පාරිභෝගික පරිභෝජන රටා වඩා නිවැරදිව පිළිබිඹු වීම සඳහා පාරිභෝගික මිල දර්ශක ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ විශිෂ්ට පරිචයන්ට අනුකූලව නිශ්චිත කාලපරාසයන් තුළ යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ. පාරිභෝගික මිල දර්ශක යාවත්කාලීන කිරීම තුළින් ඒවායේ ප්‍රධාන අංගයන්හි වැඩිදියුණුවක් සිදු කෙරෙන අතර විශේෂයෙන්ම, පාරිභෝගික මිල දර්ශකයන්ට අදාළ භාණ්ඩ පැසෙහි අඩංගු භාණ්ඩ හා සේවාවල පරිභෝජන ප්‍රමුඛතාව නිරූපණය වන පරිදි බර තැබීම් සංයුතියේ වෙනස්කම් සිදු කරනු ලබයි. මීට අමතරව, එම දර්ශකවලට අදාළ භාණ්ඩ පැසෙහි සංයුතියෙහි ද වෙනස්කම් සිදු කරනු ලබන අතර, පාරිභෝගික පරිභෝජන රටාවේ සිදුව ඇති වෙනස්කම් අනුව යම් යම් භාණ්ඩ හා සේවා අදාළ භාණ්ඩ පැසෙන් ඉවත් කිරීම මෙන්ම අලුතින් භාණ්ඩ හා සේවා, එම පැසට එක් කිරීම ද සිදු කරනු ලබයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ නිල පාරිභෝගික මිල දර්ශක වන, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂයන් 2021 වශයෙන් යාවත්කාලීන කරන ලද අතර, නව පදනම් වර්ෂය අනුව සම්පාදනය කරනු ලැබූ දර්ශක 2023 පෙබරවාරි මස සිට නිකුත් කරන ලදී. මුල්වරට 1952 වසර පදනම් කරගනිමින් හඳුන්වා දුන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි මේ දක්වා පදනම් වර්ෂ යාවත්කාලීන කිරීම් හතරක් සිදු කර ඇති අතර, ඒ අනුව 1952, 2002, 2006/07, 2013 සහ 2021 යන පදනම් වර්ෂවලට අදාළව දර්ශක ශ්‍රේණි ගණනය කරනු ලැබ ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකය සම්බන්ධයෙන් ගත් කළ, පළමු දර්ශක ශ්‍රේණිය, පදනම් වර්ෂය 2013 ලෙස සලකා ගණනය කරනු ලැබූ අතර, ඉන්පසුව එහි පදනම් වර්ෂය 2021 වශයෙන් යාවත්කාලීන කරන ලදී. පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියේ දී පාරිභෝගික මිල දර්ශක ගණනය කරනු ලබන ක්‍රමවේදයන් ද වෙනස් කරනු ලැබූ අතර, නවතම ක්‍රමවේදයට අනුව දර්ශක ගණනය කිරීම අදියර දෙකකින් සිදු කරනු ලබයි. ඒ අනුව, මූලික දර්ශක ගණනය කිරීම සඳහා ගුණෝත්තර මධ්‍යන්‍යය (geometric mean) හෝ ජෙවෝන්ස් සමීකරණය (Jevons Formula) යොදාගනු ලබන අතර ද්විතීයික දර්ශක ගණනය කිරීම සඳහා යන්ග් සමීකරණය (Young Formula) භාවිතා කරනු ලබයි. පාරිභෝගික මිල දර්ශකයන්හි අයිතමවල බර තැබීම් ගණනය කිරීම සඳහා, කුටුම්බයක් විසින් සිය පරිභෝජනය සඳහා සිදු කරනු ලැබූ සියලුම වියදම් ආවරණය වන පරිදි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයේ දත්ත හා තොරතුරු පදනම් කරගන්නා ලදී. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) බර තැබීම් ගණනය කිරීම

**සංඛ්‍යා සටහන වි.ස. 6.1**


**නිල පාරිභෝගික මිල දර්ශකයන්ගේ මූලික ලක්ෂණ**

| මූලික ලක්ෂණ | කො.පා.මි.ද. (2013=100) | කො.පා.මි.ද. (2021=100) | ජා.පා.මි.ද. (2013=100) | ජා.පා.මි.ද. (2021=100) |
|---|---|---|---|---|
| දර්ශකයේ මූලාශ්‍ර වසර | 2013 | 2021 | 2013 | 2021 |
| බර තැබීමේ මූලාශ්‍ර වසර | 2012 ජූලි - 2013 ජුනි | 2019 ජනවාරි - 2019 දෙසැම්බර් | 2012 ජූලි - 2013 ජුනි | 2019 ජනවාරි - 2019 දෙසැම්බර් |
| භූගෝලීය ආවරණය | කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම නාගරික ප්‍රදේශ | කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම නාගරික ප්‍රදේශ | මුළු දිවයිනේ සියලුම පළාත් | මුළු දිවයිනේ සියලුම පළාත් |
| එක් කුටුම්බයක ප්‍රමාණය | 3.9 | 3.8 | 3.9 | 3.7 |
| මාසික සාමාන්‍ය පරිභෝජන වියදම (රු.) | රු. 60,364.73 | රු. 91,880.34 | රු. 32,142.69 | රු. 50,728.60 |
| දර්ශකාංකයක අගය | 603.65 | 918.80 | 321.43 | 507.29 |
| ප්‍රධාන කාණ්ඩ | 12 | 12 | 12 | 12 |
| උප කාණ්ඩ | 105 | 105 | 105 | 105 |
| මුළු අයිතම ගණන | 392 | 426 | 407 | 485 |
| මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස | | | | |
| ආහාර | 28.24 | 26.23 | 44.04 | 39.22 |
| ආහාර නොවන | 71.76 | 73.77 | 55.96 | 60.78 |
| මිල එකතු කිරීම සඳහා යොදා ගන්නා මධ්‍යස්ථාන ගණන | 14 | 10 | දිස්ත්‍රික්කයක නගරයකින් අලෙවිසැල් තුනක් යොදා ගනු ලබයි. | දිස්ත්‍රික්කයක නගරයකින් අලෙවිසැල් තුනක් යොදා ගනු ලබයි. |

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


4

**රූප සටහන වි.ස. 6.1**
**කො.පා.මි.ද. (2013=100) සිට කො.පා.මි.ද (2021=100) දක්වා බර තැබීම් ව්‍යුහයන්හි සිදු වූ වෙනස්කම්**





මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන වි.ස. 6.2**
**ජා.පා.මි.ද. (2013=100) සිට ජා.පා.මි.ද (2021=100) දක්වා බර තැබීම් ව්‍යුහයන්හි සිදු වූ වෙනස්කම්**





මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන වි.ස. 6.3**
**මාසික ප්‍රතිශත වෙනසෙහි විචලන**
**කො.පා.මි.ද. (2013=100) සහ කො.පා.මි.ද (2021=100)**




මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන වි.ස. 6.4**
**මාසික ප්‍රතිශත වෙනසෙහි විචලන**
**ජා.පා.මි.ද. (2013=100) සහ ජා.පා.මි.ද (2021=100)**




මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සඳහා 2019 වසර යොදා ගෙන ඇති අතර, 2018 ජනවාරි මාසයේ සිට 2019 දෙසැම්බර් මාසය දක්වා කාල පරාසය තුළ වාර්තා වූ මිල ගණන් මෙම පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීමේ දී පදනම් මිල ලෙස යොදා ගනු ලැබ ඇත. තවද, දර්ශක ගණනය කිරීමේ දී දර්ශක අගය සියයට සමාන කරනු ලබන පදනම් වර්ෂය ලෙස 2021 වසර යොදාගනු ලැබ ඇත. නිල පාරිභෝගික මිල දර්ශකයන්ගේ මූලික ලක්ෂණ සංඛ්‍යා සටහන වි.ස. 6.1හි දක්වා ඇත.

පාරිභෝගික මිල දර්ශකයන්ගේ පදනම් වර්ෂ යාවත්කාලීන කිරීමේ දී ඒවායේ බර තැබීමේ ව්‍යුහයන් විවිධ වෙනස්කම්වලට ලක්ව ඇත. ඒ අතර සැලකිය යුතු වෙනසක් වන්නේ භාණ්ඩ පැසෙහි මුළු වියදමින් ආහාර අයිතම සඳහා වන වියදම් ප්‍රතිශතය පහළ යෑම සහ ආහාර නොවන අයිතම සඳහා වන වියදම් ප්‍රතිශතය ඉහළ යෑමයි. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ආහාර සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 28.24හි සිට සියයට 26.23 දක්වා පහත වැටුණු අතර ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ආහාර සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 44.04හි සිට සියයට 39.22 දක්වා පහත වැටුණි. මීට අමතරව, පදනම් වර්ෂ යාවත්කාලීන කිරීමේ දී පෙති කැපූ පාන්, දඹල සහ කොමඩු යන අයිතම භාණ්ඩ පැසට අලුතින් එක් වූ අතර නැවුම් හාල්මැස්සන්, කකුළුවන් සහ තල තෙල් වැනි ආහාර අයිතම භාණ්ඩ පැසෙන් ඉවත් කෙරිණි. මේ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ආහාර නොවන අයිතම සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 71.76හි සිට සියයට 73.77 දක්වා ඉහළ ගිය අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ආහාර නොවන කාණ්ඩය සඳහා වන වියදම් ප්‍රතිශතය සියයට 55.96හි සිට සියයට 60.78 දක්වා ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයේ අයිතම සැලකූ විට, මේස සහ මැහුම් කූලී වැනි අයිතම අලුතින් එක් වූ අතර සුරුට්ටු, වානේ අල්මාරි සහ වියළි කෝෂ (බැටරි) වැනි අයිතම භාණ්ඩ පැසෙන් ඉවත් වී ඇත. එමෙන්ම, මෙම පදනම් වර්ෂ යාවත්කාලීන කිරීමේ දී, නිවාස, ජලය, විදුලිය සහ

අනෙකුත් ඉන්ධන; ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග; සහ ප්‍රවාහන යන උප කාණ්ඩ, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ඉහළම වියදමක් දරන උප කාණ්ඩ ලෙස තවදුරටත් පවතී.

මෙම පාරිභෝගික මිල දර්ශක දෙකටම පොදු කාලපරාසය 2022 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වන අතර, එම පොදු කාලපරාසයේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ 2013 සහ 2021 යන පදනම් වර්ෂ දෙකටම අදාළව වාර්තා වූ මාසික ප්‍රතිශත වෙනස්කම්, වි.ස. 6.3 සහ වි.ස. 6.4 රූප සටහන් මගින් පෙන්නුම් කරනු ලබයි. මෙම රූප සටහන්වලින් දක්වා ඇති පරිදි ජා.පා.මි. සහ කො.පා.මි. දර්ශක දෙකෙහි 2013 සහ 2021 පදනම් වර්ෂ යටතේ ගණනය කරනු ලැබූ මාසික ප්‍රතිශත වෙනස්කම් සසඳා බැලීමේ දී ඉතා සුළු වෙනසක් පමණක් දක්නට ලැබෙන අතර, මෙම දර්ශකවල බර තැබීමේ ව්‍යුහයන්හි ඉතා සුළු වෙනස්කම් පමණක් සිදු වීම ඊට හේතු වී තිබේ. කෙසේ වුවද, පාරිභෝගික මිල දර්ශක, ආර්ථිකය සම්බන්ධ තීරණ ගැනීමේ දී ඉතා තීරණාත්මක කර්තව්‍යයක් ඉටු කරන බැවින්, කාලයත් සමඟ වෙනස්වන පාරිභෝගික පරිභෝජන රටා මැනවින් පිළිබිඹු වන ලෙස ඒවායේ පදනම් වර්ෂයන් නියමිත කාලපරාසයක දී යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ.

මූලාශ්‍ර

1. Department of Census and Statistics. A Briefing on the Rebased Colombo Consumer Price Index (Base 2021=100) for Sri Lanka. Available at: http://www.statistics.gov.lk/Information And Prices/Statistical Information/MonthlyCCP/Technical _Note
2. Department of Census and Statistics. A Briefing on the Rebased National Consumer Price Index (Base 2021=100) for Sri Lanka. Available at:http://www.statistics.gov.lk/InflationAnd Prices/Statistical Information/NCPI/NCPITechnicalNote

ආහාර නොවන කාණ්ඩයේ වාර්තා වූ ඉහළම මාසික වැඩිවීම වන සියයට 8.6, 2022 මැයි මාසයේ දී වාර්තා විය. ඒ අනුව, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2022 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 16.8හි සිට සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7 දක්වා අඛණ්ඩව ඉහළ ගිය අතර, ඉන් අනතුරුව 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 59.2 දක්වා පහළ ගියේය.

## නිෂ්පාදක මිල දර්ශකය (නි.මි.ද.)

**දේශීය භාණ්ඩ නිෂ්පාදකයන්ට සිය නිෂ්පාදන සඳහා ලැබෙන මිල ගණන්වල සාමාන්‍යය මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, නි.මි.ද. (2018 සිව්වන කාර්තුව=100), 2022 ජනවාරි මාසයේ වාර්තා කළ දර්ශකාංක 137.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 251.4 දක්වා සමස්ත ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** 2022 පෙබරවාරි මාසයේ සිට


**4.12 රූප සටහන**
**නි.මි. දර්ශකයෙහි විචලන**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අගෝස්තු මාසය දක්වා නි.මි.ද. පෙන්නුම් කළ සැලකිය යුතු ඉහළ යෑමට, එම දර්ශකයේ ඉහළම බර තැබීම සහිත නිෂ්පාදන උප අංශය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ඉන් අනතුරුව, එම දර්ශකය 2022 වසරේ ඉතිරි කාලය තුළ දී ස්ථාවර මට්ටමක පැවතුණි. නි.මි. දර්ශකයෙහි කෘෂිකර්මාන්ත උප දර්ශකය 2022 ජනවාරි මාසයේ දී දර්ශකාංක 164.1ක් ලෙස වාර්තා වූ අතර, 2022 වසරේ පළමු භාගයේ දී එය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඉන් අනතුරුව ස්ථාවර මට්ටමක පැවති 2022 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 238.6ක් කරා ළඟා විය. මේ අතර, නිෂ්පාදන උප අංශයේ නි.මි.ද. 2022 ජනවාරි මාසයේ දී දර්ශකාංක 135.3ක් සහ දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 257.0ක් වාර්තා කළ අතර, 2022 වසර තුළ මෙම උප අංශයේ මාසික පහළ යෑම් වාර්තා වූයේ සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල දී පමණි. 2022 ජනවාරි මාසයේ දී, දර්ශකාංක 103.3ක් වාර්තා කළ උපයෝගිතා (විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම සහ ජලය එක්රැස් කිරීම, ප්‍රතිකාරක යෙදීම හා සැපයීම) උප අංශයේ නි.මි.ද., 2022 වසර තුළ සිදු කළ විදුලි සහ ජල ගාස්තු ඉහළ දැමීම් හේතුවෙන් අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඉන් අනතුරුව, දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 174.2 දක්වා ළඟා විය. ඒ අනුව, නිෂ්පාදක මිල දර්ශකයේ (2018 සිව්වන කාර්තුව=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය 2022 අගෝස්තු මාසය දක්වා ඉහළ ගිය අතර, ඉන් අනතුරුව 2022 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 89.0 දක්වා පහළ ගියේය.

**4.13 රූප සටහන**
**2022 වසරේ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

## 4.3 වැටුප්

4

**2022 වසරේ දී විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් ඉහළ ගිය නමුත්, වසර තුළ සිදු වූ මිල ඉහළ යෑම් හා අනුරූපව වැටුප් ඉහළ නොයෑම හේතුවෙන්, 2021 වසරට සාපේක්ෂව එම සියලුම අංශවල සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් පහළ ගියේය.** අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් වැඩි වීම කෙරෙහි, ජීවන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යෑමත් සමඟ සේවකයන් විසින් ඉහළ වැටුප් ඉල්ලීම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, රාජ්‍ය අංශයේ සියලු සේවා නියුක්තිකයන් සඳහා රුපියල් 5,000ක විශේෂ දීමනාවක් ගෙවීම, එම අංශයේ නාමික වැටුප් ඉහළ යෑම කෙරෙහි බලපාන ලදී.

### පෞද්ගලික අංශයේ වැටුප්

**අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2022 වසර තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** ඒ අනුව, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100), 2021 වසරේ වාර්තා කළ සියයට 9.2 ඉහළ යෑමට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 24.5කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එම දර්ශකයේ උප ක්‍රියාකාරකම්, එනම් කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා ක්‍රියාකාරකම්වලට අදාළ දර්ශක 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී, පිළිවෙළින්, සියයට 27.6කින්, සියයට 22.4කින් සහ සියයට 26.4කින් ඉහළ ගියේය. නොවැම්බර් මාසය හැර 2022 වසරේ අනෙකුත් සියලුම මාසවල දී නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය මාසික ඉහළ යෑම් වාර්තා කළේය. මෙම ඉහළ යෑම් සඳහා වසර තුළ ජීවන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් දෛනික වැටුප් ලබන්නන් විසින් ඉහළ වැටුප් සඳහා කළ ඉල්ලීම් ප්‍රධාන වශයෙන් හේතු විය. නොවැම්බර් මාසයේ දී මෙම දර්ශකයේ වාර්තා වූ පහළ යෑම සඳහා කර්මාන්ත (නිෂ්පාදන සහ ඉදිකිරීම්) සහ සේවා (තොග හා සිල්ලර වෙළඳාම; මෝටර් රථ සහ යතුරුපැදි අලුත්වැඩියා කිරීම; නවාතැන් සහ ආහාර සැපයීම් කටයුතු; සහ කොණ්ඩා මෝස්තර සැකසුම් සහ අනෙකුත් රූපලාවන්‍ය සත්කාර) සම්බන්ධ ක්‍රියාකාරකම්වල දක්නට ලැබුණු පහළ යෑම් ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2022 වසර තුළ දී ආර්ථිකය සැලකිය යුතු ලෙස සංකෝචනය වීම, පාරිභෝගිකයා විසින් සිය ක්‍රය ශක්තිය අඩු වීම පිළිබඳව සැලකිල්ලට ගනිමින් සිය මූලික අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය ලබා දීම සහ එල්.පී. ගෑස්, ඉන්ධන සහ විදුලිය වැනි උපයෝගිතාවල පැවති සැපයුම් හිඟතා හේතුවෙන් වැඩ කරන පැය ගණන අඩු වීම වැනි හේතු මත පැන නැගුණු දුෂ්කරතා මධ්‍යයේ අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් තීරණය කිරීම සඳහා සේව්‍යයා සහ සේවකයා අතර වූ අවබෝධය හා සාකච්ඡා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. මීට අමතරව, සිමෙන්ති නොමැතිකම හේතුවෙන් සිමෙන්ති ගඩොල් හා අනෙකුත් සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම තිරිඟු පිටි නොමැති වීම හේතුවෙන් බේකරි/ආපනශාලා මෙහෙයුම් වැනි කටයුතු තාවකාලිකව අත්හිටවනු ලැබූ අතර, එමගින් අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ ජීවනෝපායන්ට අහිතකර බලපෑම් ඇති විය. සමස්තයක් ලෙස ගත් කළ, 2022 වසරේ පැවති ඉහළ උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් 2021 වසරට සාපේක්ෂව සියයට 15.7කින් පහළ ගියේය.

**පඩි පාලක සභා මගින් පාලනය වන සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය[4] (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, 2022 වසරේ දී සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය.** මෙම සේවා නියුක්තිකයන්ගේ අවම නාමික

4 පඩි පාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් ගණනය කරනු ලබයි.

වැටුප් ප්‍රමාණ දර්ශකය, පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 9.8කින් ඉහළ ගිය අතර, මේ සඳහා 2021 වසර ආරම්භයේ දී පැවති පහළ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතු විය. තේ සහ රබර් වගා කිරීම හා නිෂ්පාදනය සඳහා අදාළ පඩි පාලක සභා හරහා, තේ සහ රබර් වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප, 2021 මාර්තු මස 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 1,000 දක්වා වැඩි කෙරිණි. තවද, 2016 අංක 3 දරන ජාතික අවම සේවක වැටුප් පනතට සිදු කළ සංශෝධනය මගින් පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප 2021 අගෝස්තු මස 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 10,000 සිට රුපියල් 12,500ක් සහ අවම දෛනික වැටුප රුපියල් 400 සිට රුපියල් 500ක් දක්වා ඉහළ දමන ලදී. මේ අතර, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 22.7කින් පහළ යෑම සඳහා, පැවති ඉහළ උද්ධමනකාරී තත්ත්වය ප්‍රධාන වශයෙන් හේතු විය.

### රාජ්‍ය අංශයේ වැටුප්

**ඉහළ යන ජීවන වියදමට සහනයක් ලෙස රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිකයන්ට මුදල් අමාත්‍යාංශය විසින් 2022 වසර ආරම්භයේ දී රුපියල් 5,000ක විශේෂ දීමනාවක් ලබා දෙන ලදී.** විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ වැටුප් සම්බන්ධයෙන් පැවති විෂමතා ඉවත් කිරීමේ අරමුණින් ඔවුන්ගේ වැටුප් 2022 ජනවාරි මාසයේ දී ඉහළ නංවන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, වසර දෙකකට පසුව 2022 ජනවාරි මාසයේ දී ඉහළ ගිය ද, එතැන් සිට නොවෙනස්ව පැවතුණි. ඒ අනුව, රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100), පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 16.1කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, පැවති උද්ධමන ප්‍රවණතා මධ්‍යයේ 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප් සියයට 20.6ක පහළ යෑමක් පෙන්නුම් කළේය.

4